# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

එම්.ඒ.ආර්. රුවනි චම්පිකා
අංක 180,
පැලැස්ස ගෙදර
පුහුල්යාය
අම්බලන්තොට

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 23/2022**

**එදිරිව**

ප්‍රාදේශීය ලේකම්
කාර්යාලය
අඟුණකොළපැලැස්ස
අඟුණකොළපැලැස්ස

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික)- සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක පෙනී සිටී

පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීමක් නැත

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2022.08.08

**තීරණය කළ දිනය :** 2022.08.08

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.08.16 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*මාගේ මව වූ වන්නි ආරච්චි අබේගුණවර්ධන සුමනාවතී යන අයට හිමි මධ්‍යම පාන්තික ඉඩමක් වන බලපත්‍ර අංක LL 559 දරණ ඉඩමේ අනුප්‍රාප්තිකත්වය මා නමින් 2017.08.07 දින පවරන ලදී. එකී පැවරීමට අදාළ ලේඛනයන්හි අනුපිටපතක්*

මෙම තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් 2021.09.24 වන දින තොරතුරු නිලධාරි විසින් පහත ප්‍රතිචාර දක්වා ඇත.

*ඔබ විසින් 2021.08.16 වන දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක DSAN/RTI/41 දරණ තොරතුරු ඉල්ලීමෙහි සඳහන් එල් එල් 559 අංක දරණ බලපත්‍ර ඉඩම පිළිබඳ තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් ඔබගේ සහෝදරයෙකු වන එම්.ඒ. සිසිර මයා විසින් ඔහුගේ විරුද්ධත්වය දැනුම් දී ඇත. එබැවින් පනතේ විධිවිධාන අනුව ඉල්ලා ඇති තොරතුරු ලබාදීමට තුන්වන පාර්ශවය එකඟ නොවීමේ හේතුව මත ඔබ විසින් ඉල්ලා සිටින තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි.*

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2021.09.25 වන දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. මෙයට ප්‍රතිචාර වශයෙන් නම් කළ නිලධාරි විසින් 2021.10.15 වන දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ලියාපදිංචි අංක DSAN/RTI/41 දරණ 2021.08.16 දිනැතිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඔබ විසින් ඉදිරිපත් කරන ලද RTI 01 තොරතුරු ඉල්ලීමේ අයදුම් පත්‍රයට අදාළ වන එල් එල් 559 අංක දරණ බලපත්‍ර ඉඩමේ මුල් අයිතිය මේ වන විට ඔබගේ සහෝදරයෙකු වන එම්.ඒ. සිසිර මයා වෙත පවරා ඇත.*

*02. එබැවින් ඉහත කී ඉඩමට අදාළ තොරතුරු වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම පිළිබඳව ඔහුගේ විරෝධතාවය ප්‍රකාශ කර ඇත.*

*03. ඒ අනුව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 29(2)(ඇ) වගන්තිය යටතේ ඔබගේ තොරතුරු ඉල්ලීමේ අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කාරුණිකව දන්වමි.*

මෙම පිළිතුරෙන්ද අතෘප්තියට පත් අභියාචක 2021.11.02 වන දින මෙම අභියාචනය කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

**සළකා බැලීම**

ඉහත සදහන් තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු තුන්වන පාර්ශවයකට අයත් තොරතුරු බව ප්‍රකාශ කරමින් එකී තොරතුරු මුදා හැරිම පොදු අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කර ඇත. අභියාචක ඉල්ලා ඇත්තේ ඇය අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන ලද ඉඩම් සංවර්ධනය කිරීමේ ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක ඊට අදාල තොරතුරු වේ. බලපත්‍රයෙහි, අභියාචක අනුප්‍රාප්තිකයකු වශයෙන් නම් කර ඇති බැවින්, බලපත්‍රයෙහි පසු උරුමකාරිත්වය පසු අවස්ථාවකදී වෙනස් වුවත් එය දැනගැනීමේ අයිතිවාසිකම අභියාචකට ඇති බැවින් තෙවන පාර්ශවයකට අයත් තොරතුරු යන පදනම මත ඉහත සදහන් තොරතුරු ඉල්ලීමට අදාල තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කල නොහැක.

එසේ හෙයින් 2022.09.09 යන දිනට ප්‍රථම ඉහත කී තොරතුරු ඉල්ලීමෙහි අඩංගු සියලුම තොරතුරු, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කල යුතු බව තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

**කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.**

**අභියාචනය අවසන් කරන ලදී.**